25.	සුව ධරණී(සාම්පල් 04)		ආයුර්වේද දෙපාර්තමේන්තුව
26.	සුව ධරණී(සාම්පල් 04)		ආයුර්වේද දෙපාර්තමේන්තුව
27.	දාරු පර්පට ක්වාථය, (සාම්පල් 01)		ආයුර්වේද ඖෂධ සංස්ථාව
28.	තල සතකුප්ප (සාම්පල් 01)		ආයුර්වේද ඖෂධ සංස්ථාව
29.	හීන් බිංකොහොඹ (සාම්පල් 01)	BMARI GARDEN	
30.	නානු (සාම්පල් 01)	ඖෂධ නිෂ්පාදනාගාරය	
31.	ඉරිවේරිය(සාම්පල් 01)	BMARI GARDEN	

32.	ත්‍රිඵලා ක්වාතය(සාම්පල් 01)	බාහිර ඖෂධාලය	
33.	ත්‍රිඵලා චූර්ණය(සාම්පල් 01)	බාහිර ඖෂධාලය	
34.	අරළු (සාම්පල් 01)	ඖෂධ නිෂ්පාදනාගාරය	
35.	බුළු (සාම්පල් 01)	ඖෂධ නිෂ්පාදනාගාරය	
36.	නෙල්ලි (සාම්පල් 01)	ඖෂධ නිෂ්පාදනාගාරය	
37.	මලිත (සාම්පල් 01)	උද්භිද විද්‍යා අංශය	
38.	සැවැන්දරා (සාම්පල් 01)	උද්භිද විද්‍යා අංශය	
39.	හීං අරත්ත (සාම්පල් 01)	උද්භිද විද්‍යා අංශය	
40.	එළබටු (සාම්පල් 01)	උද්භිද විද්‍යා අංශය	
41.	ඉඟුරු (සාම්පල් 01)	උද්භිද විද්‍යා අංශය	
42.	කොල්ලං කොල (සාම්පල් 01)	උද්භිද විද්‍යා අංශය	
43.	බැබිල (සාම්පල් 01)	උද්භිද විද්‍යා අංශය	
44.	අවිපත්තිකර චූර්ණය (සාම්පල් 01)	බාහිර ඖෂධාලය	
45.	චීන අල චූර්ණය (සාම්පල් 01)	බාහිර ඖෂධාලය	
46.	ගුඩුච්‍යාදී චූර්ණය(සාම්පල් 01)	බාහිර ඖෂධාලය	
47.	අමුක්කාරා (සාම්පල් 01)	උද්භිද විද්‍යා අංශය	
48.	කටුවැල් බටු (සාම්පල් 01)	උද්භිද විද්‍යා අංශය	
49.	බිං තල් චූර්ණය (සාම්පල් 01)	බාහිර ඖෂධාලය	
50.	ධාත්‍රී චූර්ණය (සාම්පල් 01)	බාහිර ඖෂධාලය	
51.	කාර්ව්‍යාදී චූර්ණය (සාම්පල් 01)	බාහිර ඖෂධාලය	
52.	සතකුප්ප චූර්ණය (සාම්පල් 01)	බාහිර ඖෂධාලය	
53.	අශ්වගන්ධ චූර්ණය (සාම්පල් 01)	බාහිර ඖෂධාලය	
54.	භාෂ්කර චූර්ණය (සාම්පල් 01)	බාහිර ඖෂධාලය	
55.	ලවංගාදී චූර්ණය (සාම්පල් 01)	බාහිර ඖෂධාලය	
56.	තාලිසාදී චූර්ණය (සාම්පල් 01)	බාහිර ඖෂධාලය	
57.	ඉඟුරු පියලි චූර්ණය (සාම්පල් 01)	BMARI GARDEN	
58.	ආමලකී චූර්ණය (සාම්පල් 01)	බාහිර ඖෂධාලය	
59.	සුදර්ශන චූර්ණය (සාම්පල් 01)	බාහිර ඖෂධාලය	
60.	ශතාවරී චූර්ණය (සාම්පල් 01)	බාහිර ඖෂධාලය	
61.	ධාන්‍ය පංචකය චූර්ණය (සාම්පල් 01)	බාහිර ඖෂධාලය	
62.	හිඟුවාෂ්ඨකය චූර්ණය (සාම්පල් 01)	බාහිර ඖෂධාලය	
63.	මානිභද්‍ර චූර්ණය (සාම්පල් 01)	බාහිර ඖෂධාලය	

2.1.8.4 පර්යේෂණ ප්‍රගතිය - සායන අංශය

පර්යේෂණ ක්ෂේත්‍රය	පර්යේෂණ මාතෘකාව	අපේක්ෂිත නිමැයුම	ආරම්භ කල වර්ෂය	ප්‍රගතිය(%)	පර්යේෂණ කන්ඩායම
සායන අංශය	DETERIMINATIONOF	පීනස සම්බන්ධව වඩා සාර්ථක	2021-දෙසැම්බර්	10%	වෛද්‍ය ඩී.එන්.වීරසිංහ වෛද්‍ය උදාරි

	EFFECTIVENESS OF AV PANTA KASAYA ON ALLERGIC RHIHITIS	ප්‍රායෝගික ප්‍රතිකාර ක්‍රමයක් සෙවීම.			වීරක්කොඩි වෛද්‍ය එන්.කේ.අබේසුන්දර
Drug Research (Diabetic)	To scientifically validate the management of Diabetic (treatment system drug & relative procedures	1. To assess the glucose tolerance and toxicity of the herbal preparation & medicinal plant . RAT Model – (Histopath& Toxicity 2021 July Completed)	2020-December	100% Prepared for the published in Journal	වෛද්‍ය රුවිනි මෙන්ඩිස්
		2.Assessing the anti glycation anti-Oxidant & and drug Standardization of the herbal preparation & medicinal plants Used for the Diabetic mellitus	2018 January	60% antioxidant activity complied	වෛද්‍ය රුවිනි මෙන්ඩිස්
සායනික	Assessment of bioactivity of selected Ayurvedic treatment modalities in cancer patients	දේශීය වෛද්‍ය චිකිත්සා පද්ධතිවලින් යෙදවීමේ සාපල්‍යතාවය සෙවීම	2017	දත්ත විශ්ලේශණය (75%)	වෛද්‍ය එල්.එච්.එස්.උමයංගනී
සායනික	Anti-hyperlipidemic Effect of Dasanga Guggullu for the Management of *Medovriddhi* (Hyperlipidemia)	මේදෝ වෘද්ධිරෝගීන් සඳහා දශාංග ගුග්ගුලු ඖෂධය සාඵල්‍යතාවය සෙවීම	2021	ආචාරධර්ම කමිටුවේ අනුමැතිය ලබාගෙන ඇත. අදාළ ඖෂධය නිෂ්පාදනය ආරම්භ කර ඇත.	
රසායනික විශ්ලේෂණ	Standardization of *Dashangagugglu*	ප්‍රමිතියෙන් යුතු දශාංග ගුග්ගුලු ඖෂධය නිෂ්පාදනය	2021	ප්‍රමිතියෙන් යුතු ඒකීය ඖෂධ	

	–a polyherbal drug preparation			හඳුනාගැනීම	
රසායනික විශ්ලේෂණ	Standardization of*Guggulu*	ගුගුල් සඳහා ප්‍රමිති ගත පරාමිතීන් සැකසීම	2021	විවිධ ගුගුල් සාම්පල ලබා ගැනීම අදාල පර්යේෂණය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීමට කටයුතු කිරීම	
සමීක්ෂණ	Association of *Prakruti* (Personal body constitution) with Risk factors of Metabolic Syndrome among young adults attending to the Government Ayurveda hospitals in Colombo district: A Cross sectional Survey	පරිවෘත්තීය අවදානම් සාධක සහිත රෝගීන් යොදා ගනිමින් ඔවුන්ගේ ප්‍රකෘතිය පිළිබඳව අධ්‍යයනය කිරීම	2021	ආචාරධර්ම කමිටුවේ අනුමැතිය ලබාගෙන ඇත. රුධිර වාර්තා සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබාගැනීමට කටයුතු කිරීම.	
ජෛව තාක්ෂණික	Association of *Prakriti* (Personal body constitution) with gene polymorphism in Hyperlipidemia patients	මේදෝ වෘධි රෝගීන්ගේ ප්‍රකෘතිය සහ ජානමය සම්බන්ධතාවය සෙවීම	**2021**	බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණාය තනය ආචාර්යධර්ම කමිටුවට ඉදිරිපත් කර ඇත	

2.1.8.5 වෙනත් වැඩසටහන්

ව්‍යාප්ති සේවා / දැනුවත් කිරීමේ වැඩසටහන්:-

ව්‍යාප්ති සේවා	විස්තරය	සේවාව ලබා දුන් ආයතනය/පුද්ගල කණ්ඩායම
		රජයේ ආයතන
පර්යේෂණාගාර පුහුණු පාඨමාලාව 2021	ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා පර්යේෂණාගාර පුහුණු පාඨමාලාව	බොරැල්ල ආයුර්වේද රෝහල හා බණ්ඩාරණායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනයේ වෛද්‍ය වරුන් සඳහා

අත් පත්‍රිකා ග්‍රන්ථ සකස් කිරීම

අත් පත්‍රිකා ග්‍රන්ථ සකස් කිරීම	විෂය ක්ෂේත්‍රය	මාතෘකාව	සහය වූ අංශය/ ආයතනය
පර්යේෂණ ලිපිය ආයුර්වේද සංහිතාව 2021.04.17	ඖෂධ පර්යේෂණ	Anti exigent active of the ranawara paspanguwa using piranha	ආයුර්වේද දෙපාර්තමෙන්තුව (වෛද්‍ය රුවිනි මෙන්ඩිස්)

2.1.9 ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන සේවය - අනුරාධපුරය

ව්‍යාපෘතිය/ වැඩසටහන	පැවැත් වූ වැඩසටහන් සංඛ්‍යාව	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
	2021	**2021**
බෝ නොවන රෝග පාලනය	1,924	25,679
ප්‍රජා මූලික වැඩිහිටි සෞඛ්‍ය සේවා වැඩසටහන	71	10,789
පාසල් වැඩසටහන්	42	822
පෙර පාසල් වැඩසටහන්	820	13,448
වෘත්තීය සෞඛ්‍ය වැඩසටහන්	174	4,650
බෝවන රෝග පාලන වැඩසටහන	5,119	61,283
මානසික සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන	28	830
මෘතෘ සංරක්ෂණ වැඩසටහන	21	207
ගෘහ ඒකක දැනුවත් කිරීම්	80,538	209,192
දේශීය ආහාර ප්‍රචලිත කිරීම (හෙළ අහරින් සුවය රකිමු)	756	6,425
ඖෂධ පැලෑටි සංරකෂණ හා තිරසාර භාවිතය	192	1,634
වෙනත් වැඩසටහන්	328	10,847
2021 වර්ෂයේදී සිදු කරන ලද මුළු වැඩසටහන් සංඛ්‍යාව හා ප්‍රතිලාභීන් සංඛ්‍යාව	**90,013**	**345,806**
2020 වර්ෂයේදී සිදු කරන ලද මුළු වැඩසටහන් සංඛ්‍යාව හා ප්‍රතිලාභීන් සංඛ්‍යාව	**49,679**	**360,193**

2.1.10 දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය

මහජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය නගා සිටුවීම සඳහා ගුණාත්මක වෛද්‍ය සේවාවක් ලබාදීමේ අරමුණ පෙරදැරිව දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ අධ්‍යාපන අවස්ථාවන් සහ දැනුවත් වීමේ අවස්ථාවන් ඇති කොට මානව සම්පත් සංවර්ධනය කිරීම සඳහා දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය මඟින් විවිධ ඉලක්කගත කණ්ඩායම් සඳහා ක්‍රියාකාරකම් රාශියක් මෙම වසර තුළ ඉටු කර ඇත.

2.1.10.1 නවක වෛද්‍ය නිලධාරි පුහුණු වැඩසටහන් සහ සීමාවාසික වෛද්‍ය නිලධාරි පුහුණු වැඩසටහන්

දේශීය වෛද්‍ය සේවාව සැපයීම වෙනුවෙන් ක්ෂේත්‍රයට අලුතෙන් එක්වන රජයේ පත්වීම්ලාභී නවක වෛද්‍ය නිලධාරින් සඳහා සහ සීමාවාසික වෛද්‍යවරු යන කාණ්ඩායම් සඳහා ඔවුන්ගේ සේවාවේ ප්‍රමාණාත්මක සහ ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීම තුළින් මහජනතාවට වඩා ඵලදායී සෞඛ්‍ය සේවාවක් ලබා දීම පදනම් කරගනිමින් පහත දක්වා ඇති වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

අනු අංකය	වැඩසටහන/ව්‍යාපෘතිය/ක්‍රියාකාරකම	ප්‍රගතිය	පවත්වන ලද දින ගණන	පිරිවැය (රු.)
01.	සීමාවාසික වෛද්‍ය පුහුණු (අවසාන) වැඩසටහන- දෙමළ මාධ්‍ය (2021.02.03 -2021.02.11)	සිද්ධ/ යුනානි වෛද්‍ය නිලධාරීන් 30 දෙනෙකු පුහුණු කරන ලදි.	දින 07	24,014.00
02.	නවක වෛද්‍ය (ආයුර්වේද) නිලධාරීන් සේවාරම්භක පුහුණු වැඩසටහන (2021.03.01 – 2021.03.12)	නවක වෛද්‍ය නිලධාරීන් 124 දෙනෙකු පුහුණු කරන ලදි.	දින 09	270,490.00
03.	නවක වෛද්‍ය (සිද්ධ/යුනානි)නිලධාරීන් සේවාරම්භක පුහුණු වැඩසටහන (2021.03.01 – 2021.03.12)	වෛද්‍ය නිලධාරින් 33 දෙනෙකු පුහුණු කරන ලදි.	දින 09	70,535.00
04.	නවක වෛද්‍ය නිලධාරී පුහුණුවට අදාළ නායකත්ව පුහුණු වැඩසටහන- කළුතර පොලිස් විද්‍යාලය (2021.03.26 – 2021.03.28)	වෛද්‍ය නිලධාරින් 118 දෙනෙකු පුහුණු කරන ලදි.	දින 03	541,110.00
05.	සීමාවාසික වෛද්‍ය පුහුණු (ආරම්භක) වැඩසටහන (2021.03.08 – 2021.03.16)	ආයුර්වේද වෛද්‍ය නිලධාරින් 211 දෙනෙකු පුහුණු කරන ලදි.	දින 07	411,000.00
06.	සීමාවාසික වෛද්‍ය පුහුණු (ආරම්භක) වැඩසටහන- දෙමළ මාධ්‍ය (2021.03.08 – 2021.03.16)	සීමාවාසික සිද්ධ/ යුනානි වෛද්‍ය වරුන් 74 දෙනෙකු පුහුණු කරන ලදි.	දින 07	42,039.00
07.	සීමාවාසික වෛද්‍ය පුහුණු (අවසාන) වැඩසටහන (2021.11.29 – 2021.12.06)	සීමාවාසික සිද්ධ/ යුනානි වෛද්‍ය වරුන් 180 දෙනෙකු පුහුණු කරන ලදි.	දින 07	257,352.00
08.	සීමාවාසික වෛද්‍ය පුහුණු (අවසාන) වැඩසටහන- දෙමළ මාධ්‍ය (2021.11.29 – 2021.12.06)	සීමාවාසික සිද්ධ/ යුනානි වෛද්‍ය වරුන් 74 දෙනෙකු පුහුණු කරන ලදි.	දින 07	220,852.76
එකතුව				**1,837,392.76**

2.1.10.2 ප්‍රජා සෞඛ්‍ය/ මාතෘ හා ළමා පෝෂණවැඩසටහන්

ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ට අදාළව මාතෘ හා ළමා පෝෂණ ව්‍යාපෘතිය යටතේ සිදු කරන ලද වැඩසටහන්

පහත පිරිවැය දරා මාතෘ හා ළමා පෝෂණ ව්‍යාපෘතිය යටතේ පහත ක්‍රියාකරකම් ඉටු කරන ලදී.

- ආයුර්වේද වෛද්‍යවරුන්ගේ සායනික ඵලදායීතාවය ඉදිරිපත් කිරීම පහසුවීම පිණිස ගර්භිණී සහ ළමා සායනවලදී භාවිතා කිරීම සඳහා වාර්තා පතක් නිර්මාණය කිරීම.
- මාතෘ සහ ළමා සායනවලදී භාවිත කිරීමට ගර්භිණී සහ ළමා පෝෂණ මට්ටම ඉහළ නැංවීම සඳහා වූ අත් පොතක් සහ අත් පත්‍රිකා වර්ග 5ක් සකස් කිරීම.

අනු අංකය	වැඩසටහන/ව්‍යාපෘතිය/ක්‍රියාකාරකම	ප්‍රගතිය	පවත්වන ලද දින ගණන	පිරිවැය (රු.)
01.	ගැබිනි අවධියට සුදුසු ආහාර පිළිබඳ අත් පොත් නිර්මාණ වැඩමුළු පැවැත්වීම (2021.04.05 හා 2021.04.27)	ඉටු කර අවසන් අතර මුද්‍රණයට යොමු කර ඇත.	දින 02	18,865.00
02.	අත් පත්‍රිකා සංස්කරණ වැඩමුළුව (2021.04.06-2021.04.07)	නවක වෛද්‍ය නිලධාරීන් 124 දෙනෙකු දැනුවත් කරන ලදි.	දින 09	20,165.00
03.	ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් සඳහා වූ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන -දකුණු පළාත (2021.07.27–2021.07.30)	ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් 30දෙනෙකු දැනුවත් කරන ලදි.	දින04	107,215.90
04.	ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් සඳහා වූ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන රත්නපුර-පුස්සැල්ල (2021.12.08-2021.12.11)	ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් 30 දෙනෙකු දැනුවත් කරන ලදි.	දින04	100,265.80
05.	ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් සඳහා වූ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන - උතුරු පළාත (2021.11.23-2021.11.26)	ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් 25 දෙනෙකු දැනුවත් කරන ලදි.	දින04	71,990.00
06.	ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් සඳහා වූ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන- නැගෙනහිර පළාත (2021.12.08-2021.12.11)	ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් 26 දෙනෙකු දැනුවත් කරන ලදි.	දින04	60,400.00
එකතුව				**378,901.70**

2.1.10.3 පාරම්පරික වෛද්‍ය පුහුණු වැඩසටහන්

දේශීය වෛද්‍ය සේවාව සැපයීම වෙනුවෙන් ක්ෂේත්‍රයට අලුතෙන් එක්වන පාරම්පරික වෛද්‍යවරුන්හට සේවාවන් ලබා දීමේදී පවතින නීති රීති හා ඔවුන්ගේ කාර්යභාරය පුළුල් ලෙස හඳුන්වා දෙමින් වඩාත් ගුණාත්මක සේවාවක් ලබා දීම සහ අනාගත පරම්පරාව සඳහා ද පාරම්පරික වෛද්‍ය ක්‍රමය සුරක්ෂිත කර දායාද කිරීමේ අරමුණින් පහත වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.

අනු අංකය	වැඩසටහන/ව්‍යාපෘතිය/ක්‍රියාකාරකම	ප්‍රගතිය	පවත්වන ලද දින ගණන	පිරිවැය
01.	නවක ලියාපදිංචි පාරම්පරික වෛද්‍ය පුහුණු වැඩසටහන (2021.03.29 -2021.04.01)	පාරම්පරික වෛද්‍යවරුන් 30 දෙනෙකු පුහුණු කරන ලදි.	දින 04	35,370.00
එකතුව				**35,370.00**

2.1.10.4 හෙද හා වෛද්‍ය සහාය කාර්ය මණ්ඩල හා වෙනත් පුහුණු වැඩසටහන්

මහජනතාව වෙනුවෙන් ඵලදායී සේවාවක් ලබා දීමට හෙද සහ වෛද්‍ය සහාය කාර්යය මණ්ඩලයේ මානව සම්පත් සංවර්ධනය කිරීම සඳහා සහ ක්ෂේත්‍රයේ දේශීය මෙන්ම විදේශීය රැකියා අවස්ථා පුළුල් කරමින් පුහුණු ශ්‍රම බලකායක් ඇති කිරීමට විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ ක්‍රියාත්මක වූ වැඩසටහන් පහත පරිදි වේ.

අනු අංකය	වැඩසටහන/ව්‍යාපෘතිය/ක්‍රියාකාරකම	ප්‍රගතිය	පවත්වන ලද දින ගණන	පිරිවැය
01.	ඖෂධ සංයෝජක ත්‍රෛමාසික පුහුණු පාඨමාලාව (2021.02.22– 2021.11.15) *	ඖෂධ සංයෝජක නිලධාරීන් 35 දෙනෙකු පුහුණු කරන ලදී.	දින 65	390,684.74
02.	පෞද්ගලික ආයුර්වේද සම්බාහන වැඩමුළුව	සම්භාහනකරුවන් 27 දෙනෙකු පුහුණු කරමින් සිටී.	මාස 06	98,665.46
එකතුව				**489,350.20**

- (කොවිඩ් 19 හේතුවෙන් අඛණ්ඩව පැවැත්වීමට නොහැකි විය)

2.1.10.5 වෙනත් සේවාවන්

දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අමතරව, දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශය සහ ආයුර්වේද දෙපාර්තමේන්තුවෙහි මහපෙන්වීම යටතේ කාලීන අවශ්‍යතාවය මත හඳුනාගත් විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ සිදුකරන ලද සේවාවන් රැසකි.

කොවිඩ්-19 වසංගතය සම්බන්ධයෙන් මහජන සුවසෙත සඳහා සිදුකළ සේවාවන්

- කොවිඩ්-19 දේශීය වෛද්‍ය මෙහෙයුම් කමිටුව සඳහා භෞතික සහ මානව සම්පත් සපයාදීම සහ ප්‍රධාන සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම මඟින් වසංගත තත්ත්වය හමුවේ පීඩාවට පත්වූ සුවහසක් රෝගීන් ගේ සුවසෙත ආරක්ෂා කිරීම සඳහා දායකත්වය ලබාදෙන ලදී.
  පැවති වසංගත තත්ත්වය යටතේ අන්තර් ප්‍රතිකාර මධ්‍යස්ථාන ඇති කිරීමට පුරෝගාමීව කටයුතු කළ මෙම කමිටුව මඟින් දිවයින පුරා ස්ථාපිත කරන ලද රජය සහ පළාත් සභා ද ඇතුළුව පවත්වාගෙන යනු ලැබූ අන්තර් ප්‍රතිකාර මධ්‍යස්ථාන 16ක සේවාවන් ඉටු කිරීම සම්බන්ධීකරණය කරන ලදී. මෙම අන්තර් ප්‍රතිකාර මධ්‍යස්ථානවලින් රෝගීන් 12,000ක් සඳහා මේ වසර තුළ සත්කාරක සේවා සපයා ඇත.

- සුවධරණී තොරතුරු සේවාවේ සම්බන්ධීකරණ හා අධීක්ෂණ කටයුතු සිදුකිරීම
  කොවිඩ්-19 වසංගත රෝග තත්ත්වය හමුවේ ආයුර්වේද ප්‍රතිකාර පිළිබඳ උනන්දුවක් දක්වන මහජනතාවට අවශ්‍ය උපදෙස් හා මහපෙන්වීම ලබා දීම, අදාළ රෝහල්/ අන්තර් ප්‍රතිකාර මධ්‍යස්ථාන පිළිබඳ හා ඒ ආශ්‍රිත සේවාවන් මහජනතාව වෙත ක්ෂණිකව සහ ඉතා මිත්‍රශීලීව ලබා දීමේ අරමුණින් අඛණ්ඩව පැය 24 පුරා මෙම සේවාව ක්‍රියාත්මක විය. මෙමඟින් සියලුම පළාත්වල සහභාගීත්වයෙන් සේවාලාභීන් 14,746 ක් සඳහා ඉතා සාර්ථක සේවාවක් ලබා දීමට හැකි විය.

- කාලීන ප්‍රවණතාවයන් හඳුනා ගනිමින්, ජනමාධ්‍ය සමඟ එක්ව නිවෙස්ගත නිරෝධායනයට ලක්වන පිරිස් සඳහා ආයුර්වේදීය පිළිවෙත් මඟින් රෝග නිවාරණය සඳහා අවශ්‍ය වෛද්‍ය උපදෙස් ලබා දීමේ වැඩසටහන් සිදු කරන ලදී.

- නිවෙස්ගත ප්‍රතිකාර සඳහා යොමු වූ කොවිඩ්-19 ආසාදිත රෝගීන් වෙනුවෙන් මාර්ගෝපදේශන ඇතුලත් ඉ-අත්පොතක් ප්‍රකාශයට පත් කිරීම මඟින් වසංගත රෝග නිවාරණයට ආයුර්වේදීය පිළිවෙත් උපයෝගී කර ගැනීමට මහජනතාව නැඹුරු කළ හැකිවිය.

- නව සාමාන්‍යකරණ සමාජ පසුබිම තුළ පාසල් දරුවන් කොවිඩ්-19 ආසාදනයෙන් වළක්වා ගැනීම සඳහා ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් සඳහා වූ පාසල් ළමුන් දැනුවත්කිරීමේ ජාතික මාර්ගෝපදේශ ඉ-අත්පොත ප්‍රකාශයට පත්කිරීම මඟින් පාසල් දරුවන්ට සෞඛ්‍යාරක්ෂිතව අධ්‍යාපනය ලැබීමට

පසුබිමක් සකස් කිරීමට දායකත්වය ලබා දීමට හැකියාව ලැබුණි.එමෙන්ම කොවිඩ්-19 රෝගයෙන් වැළකීමේ පාසල් ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහන්ද පවත්වන ලදී.





සඵලදායී සේවාවක් මහජනතාවට ලබා දීම සඳහා දෙපාර්තමේන්තුගත වෛද්‍ය නිලධාරීන් සහ අනෙකුත් සියලු කාර්ය මණ්ඩලවල මානව සම්පත් සංවර්ධනය සඳහා සිදු කළ සේවාවන්

- හඳුනාගත් පුහුණු වැඩසටහන්හි ගුණාත්මකභාවය වැඩි කිරීම සඳහා ජාතික අධ්‍යාපන ආයතනය සමඟ එක්ව මොඩියුල නිර්මාණය කිරීමේ කටයුතු ආරම්භ කිරීම.
- වෛද්‍යවරුන් සහ අනෙකුත් සියලු කාර්ය මණ්ඩලවල පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම සඳහා දීප ව්‍යාප්ත තොරතුරු ලබා ගැනීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සහ එමඟින් වඩාත් ඉහළ ප්‍රතිචාරාත්මකභාවයෙන් (responsiveness) යුතු ගුණාත්මක භාවයෙන් ඉහළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු ආරම්භ කිරීම.

පෞද්ගලික අංශයේ මානව සම්පත් සංවර්ධනය සඳහා සිදු කළ සේවාවන්

- පෞද්ගලික අංශය සඳහා වූ සම්බාහන සහතික පත්‍ර පාඨමාලාව ආරම්භ කර පවත්වා ගෙන යෑම තුළින් විධිමත් පුහුණුව ලැබූ ශ්‍රම බලකායක් ක්ෂේත්‍රයට එක් කිරීම.
- ආයුර්වේද චිකිත්සකයන්, ආයුර්වේද රූපලාවණ්‍ය පිළිබඳ, වැඩිහිටි සත්කාරක සේවාව සහ බාහිර ඖෂධවේදීන් සඳහා වූ රාජ්‍ය පෞද්ගලික හවුල් සහතික පත්‍ර පාඨමාලාව සඳහා වූ ව්‍යාපෘති වාර්තාව ඉදිරිපත් කිරීම සහ එමඟින් සුදුසුකම් සහිත ශ්‍රම බලකායක් ක්ෂේත්‍රයට එක්කිරීම සහ දෙස් විදෙස් රැකියා අවස්ථා සඳහා පුහුණු ශ්‍රමිකයන් සුලභ කිරීම.

පොදු මහජන සුවසෙත සඳහා සිදුකළ සේවාවන්

- ආයුර්වේද නීති සංග්‍රහ කමිටු වාර්තාව නැවත සකස් කිරීමේ කටයුතු සිදු කිරීමට සම්පත් දායකත්වය ලබා දීම තුළින් සෞඛ්‍ය සේවයේ ගුණාත්මකභාවය සුරක්ෂිත කිරීම.

2.1.10.6 අනාගත සැලසුම්

- දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනයේ මානව සහ භෞතික සම්පත් සංවර්ධනය සඳහා නව සැලැස්මක් සකස් කිරීම මඟින් ආයතනයේ සේවාවන් පුළුල් කිරීම තුළින් මහජනතාවට ගුණාත්මක බවින් ඉහළ සේවයක් ලබා දීමට හැකි වීම.

- කොවිඩ්-19 ආසාදනය වී නිවසේ සිටින රෝගීන්ගේ සහ පවුලේ සාමාජිකයන්ගේ මානසික සෞඛ්‍ය කළමනාකරණය සඳහා ආයුර්වේදීය මග පෙන්වීමක් ලෙස ආයුර්වේදය තුළින් නිවෙස්ගත ඔබට මානසික සුවය අත්පොත සකස් කිරීමට සැලසුම් කර ඇත. එම අත්පොත මඟින් ආයුර්වේදීය සංකල්ප තුළින් මානසික සංකූලතා මගහරවා ගැනීමට උපකාර වීම අපේක්ෂා කෙරේ.

- කොවිඩ්-19 ආසාදනය වී සුවපත් වූවන් පුනරුත්ථාපනය සහ පශ්චාත් උපද්‍රව කළමනාකරණය සඳහා ආයුර්වේදීය මග පෙන්වීම අත්පොත සකස් කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. එමඟින් පශ්චාත් උපද්‍රව වළක්වා ගැනීම සඳහා උපදෙස් ලබාදීම සහ පශ්චාත් උපද්‍රව සඳහා පිහිටුවා ඇති ප්‍රතිකාර මධ්‍යස්ථාන වලට යොමු වීම සඳහා දැනුම්වත් කිරීම.

- සීමාවාසික පුහුණු වෛද්‍ය නිලධාරී මාර්ගෝපදේශ සහ පුහුණු අත්පොත සකස් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම සහ මෙමඟින් වෛද්‍ය සිසුන් සඳහා වඩා ඵලදායී සීමාවාසික පුහුණුවක් ලබා දීම.

- ආයුර්වේදය තුළින් වැඩිහිටි ප්‍රජාවගේ සෞඛ්‍ය සංරක්ෂණය සඳහා වූ ව්‍යාපෘතිය සිදු කිරීමට සැලසුම් සකස් කර ඇත. වර්තමානයේ පවතින ජන විකාශන වෙනස්කම් අනුව මතුවන සෞඛ්‍ය ගැටළු සඳහා පිළියම් යොදමින් වැඩිහිටි ප්‍රජාවගේ සෞඛ්‍ය මට්ටම ඉහල නංවාලීම මෙම ව්‍යාපෘතිය මඟින් අපේක්ෂා කෙරේ.

- දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය සඳහා නිල වෙබ් අඩවියක්, නිල ෆේස් බුක් පිටුවක් සහ නිල යූ ටියුබ් චැනලයක් නිර්මාණය ආරම්භ කිරීම මඟින් ආයතනයේ සේවාවන් මහජනතාවට වඩාත් සමීප කරවීම.

2.1.11 පර්යේෂණ හා ව්‍යාප්ති සේවා ඔසු උයන්

2.1.11.1 ඔසු පැල අලෙවි කාර්යයන්

ඔසු උයන	2020			2021		
	නිෂ්පාදනය කළ පැල ප්‍රමාණය	පැල අලෙවිය		නිෂ්පාදනය කළ පැල ප්‍රමාණය	පැල අලෙවිය	
		පැළ ප්‍රමාණය	වටිනාකම (රු.)		පැළ ප්‍රමාණය	වටිනාකම (රු.)
පින්නදූව	20,434	12,573	588,680	11,018	3,998	144,695
පට්ටිපොළ	10,040	2,290	99,415	7,594	2,865	97,190
පල්ලෙකැලේ	20,292	3,292	123,740	7,690	4,872	157,710
හල්දුම්මුල්ල	26,697	5,931	347,440	20,333	8,970	744,120
නාවින්න	4,774	9,690	453,275	4,700	5,646	199,280
ගිරාඳුරුකෝට්ටේ	22,329	976	38,100	15,534	628	25,640
එකතුව	**104,566**	**34,752**	**1,650,650**	**66,869**	**26,979**	**1,368,635**

2.1.11.2 නොම්ලේ පැල නිකුත් කිරීම් / ඔසු උයන් අතර පැල හුවමාරු කිරීම්

ඔසු උයන	2020		2021	
	ප්‍රමාණය	වටිනාකම (රු.)	ප්‍රමාණය	වටිනාකම (රු.)
පින්නදූව	9,752	519,280	1,485	48,910
පට්ටිපොළ	825	41,880	270	8,500
පල්ලෙකැලේ	9,472	307,240	1,293	39,110
ගිරාඳුරුකෝට්ටේ	16,900	536,280	37	1,110
නාවින්න	3,058	118,280	2,406	77,550
හල්දුම්මුල්ල	10,662	450,200	1,035	37,090
එකතුව	**50,669**	**1,973,160**	**6,526**	**212,270**

2.1.11.3 ඖෂධීය රෝපණ ද්‍රව්‍ය/ අමු ද්‍රව්‍ය නිෂ්පාදනය හා අමුද්‍රව්‍ය රෝහල් වලට නොම්ලේ ලබා දීම්

ඔසුඋයන	නිෂ්පාදනය වූ ඖෂධීය අමුද්‍රව්‍ය ගණන		ඖෂධීය අමුද්‍රව්‍ය නොම්ලේ සැපයීම්		සැපයූ ඖෂධීය රෝපණ ද්‍රව්‍ය ගණන	
	2020	2021	2020	2021	2020	2021
පට්ටිපොළ	13	-	08	02	08	01
පල්ලෙකැලේ	03	-	-	-	-	-
ගිරාඳුරුකෝට්ටේ	43	08	31	05	10	03
නාවින්න	02	02	02	02	07	-
පින්නදූව	16	06	06	06	-	06
හල්දුම්මුල්ල	11	02	11	02	05	1,035
කන්නෙලිය	-	-	-	-	-	-
එකතුව	**88**	**18**	**58**	**17**	**30**	**1,045**

2.2 ඉදිරි ඉලක්ක හා අභියෝග

1. ජාතික සෞඛ්‍ය පද්ධතිය තුළ වැඩි දායකත්වයක් ලබා දීම සඳහා ආයුර්වේද රෝහල් පද්ධතිය වඩා දියුණු මට්ටමට පත් කිරීම.
2. ආදායම් උත්පාදනය සඳහා දේශීය වෛද්‍ය ක්‍රමය යොදා ගැනීම.
3. දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයට අදාළ නිෂ්පාදන අපනයනය සඳහා පහසුකම් සැලසීම.
4. විදේශයන්ගෙන් ආනයනය කරනු ලබන ඖෂධ මෙරට වගාකිරීම තුළින් වාර්ෂිකව රු. මී. 1000ක් ඉතිරි කිරීම.
5. දේශීය වෙදකම් ප්‍රවර්ධනය සඳහා අරමුදලක් පිහිටුවීම.
6. පාරම්පරික වෛද්‍යවරුන් සඳහා දායක විශ්‍රාම වැටුප් ක්‍රමයක් ඇති කිරීම.
7. පාරම්පරික හා ආයුර්වේද වෛද්‍ය ක්‍රමය මඟින් සුව කළ හැකි පහත සඳහන් විශේෂිත රෝග සඳහා පවතින ආයුර්වේද රෝහල් 7ක් අංගසම්පූර්ණ විශේෂිත රෝහල් ලෙස වැඩිදියුණු කිරීම (ආඝාත රෝගය / විශේෂිත ස්නායු රෝග, සන්ධි රෝග, අර්ශස් / භගන්දරා, භග්න (කැඩුම් බිඳුම්), අක්ෂි රෝග, දැවුම් පිලිස්සුම්, චර්ම රෝග).
8. වැඩිහිටි සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා ක්‍රමවේදයක් සැකසීම.
9. ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා කටයුතු කිරීම.
10. අවම වශයෙන් පළාතකට එක් ගෙවන වාට්ටු පහසුකම් සහිත ආයුර්වේද රෝහලක් බැගින් ඇති කිරීම.
11. "හරිතකී" නගර ඔසු වන වැඩසටහන යටතේ ඔසු වන 500ක් බිහි කිරීම.
12. රටේ සංවර්ධනය සඳහා දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයෙන් ලබා දෙන දායකත්වය මැනීම සඳහා ක්‍රමවේදයක් සැකසීම.
13. දිස්ත්‍රික්කයකට අවම වශයෙන් එක් හෝමියෝපති සායනයක් බැගින් ඇති කර ජනතාව තුළ හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ප්‍රචලිත කිරීම.
14. දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය සඳහා රක්ෂණ ක්‍රමවේදයක් හඳුන්වා දීම.
15. දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය මඟින් ලබා දෙන සේවා හා නිෂ්පාදන වැඩි දියුණු කිරීම සඳහා ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම.
16. අන්තර් ජාතික මට්ටමේ සමුළුවක් හා ප්‍රදර්ශණයක් පැවැත්වීම.
17. ශ්‍රී ලංකා ආයුර්වේද සංස්ථාව මඟින් නව ආයුර්වේද නිෂ්පාදන 05ක් හඳුන්වාදීම. (මස්බැද්ද Tea, රක්ත චන්දන ෆේෂල් වොෂ්, වෙනිවැල් Hand Sanitizing Spray, කහ ඉඟිනය සහ පර්යේෂණ මට්ටමේ පවතින නිෂ්පාදනයන්ගෙන් තෝරාගත් නිෂ්පාදන)
18. සංස්ථාව මඟින් පවත්වාගෙන යන ඔසු උයන් නඩත්තුව, වර්ධනය කිරීම හා නව වගාවන් ඇති කිරීම.
19. රජයේ ඉඩම් ලබාගෙන නව ඔසු උයන් 03ක් ආරම්භ කිරීම. (ඉංගිරිය, මැද්දෙගෙදරවත්ත, ගිරාඳුරුකෝට්ටේ මහවැලි ඉඩම)
20. ආයුර්වේද සංරක්ෂණ සහා සමඟ ඒකාබද්ධ මී පැණි නිෂ්පාදන ව්‍යාපෘතියක් ආරම්භ කිරීම.
21. සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රම ඇතුලත් අන්තර්ජාතික වෛද්‍ය කලාපයක් ඇති කිරීම.
22. නිෂ්පාදන අපනයනය කිරීම. (ජපානය, දකුණු කොරියාව, බ්‍රිතාන්‍ය, ඕස්ට්‍රේලියාව)

23. නව ආයුර්වේද ඖෂධ අලෙවි මධ්‍යස්ථාන ආරම්භ කිරීම. (ඇඹිලිපිටිය, කිරිබත්ගොඩ, කුරුණෑගල, මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය)

2.3 අභියෝග

01. ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති වීම.
02. ආයුර්වේද ක්ෂේත්‍රයෙන් සෞඛ්‍ය අංශයට සිදුවන දායකත්වය පිළිබිඹු නොවීම.

3. පරිච්ඡේදය

ඒසීඒ-එෆ්

03. 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

ඒසීඒ-සී

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තත්‍ය	නැවත ගලපන ලද
	2021	**2020**
	රු.	**රු.**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන්tකත+කරනලද ආදායම	75,762,029	75,247,876
අග%sම ලැබීම්	2,006,012,000	1,505,595,000
අත්තිකාරම් අයකර ගැනීම්	36,130,902	25,868,363
තැන්පතු ලැබීම්	19,435,281	6,719,712
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**2,137,340,212**	**1,613,430,951**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	1,722,091,146	1,507,302,870
සහනාධාරසහ මාරුකිරීම්	13,052,680	12,648,168
වෙනත්වැයYsර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	4,103,002	8,406,646
භාණ්ඩාගාරයටපියවන ලද අගි%ම	10,700,219	1,042
අත්තිකාරම්ගෙවීම්	48,729,370	23,829,155
තැන්පතුගෙවීම්	20,561,899	9,618,737
මෙහෙයුම්ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**1,819,238,316**	**1,561,806,618**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**318,101,896**	**51,624,333**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	**-**	**-**

අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කරගැනීම්	318,101,896	51,624,333
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**318,101,896**	**51,624,333**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(318,101,896)**	**(51,624,333)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල්ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**0**	**0**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) +(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

අයවැය **2021**		සටහන	තත්‍ය නැවත ගලපන ලද **2021**	**2020**	
රු.			රු.	රු.	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	**1**	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවාමත බදු	**2**	-	-	**ඒසීඒ-1**
-	ජාත්‍යන්තර වෙළඳාම මතබදු	**3**	-	-	
-	බදු නොවන ආදායම් හාවෙනත්	**4**	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		2,006,012,000	1,505,595,000	**ඒසීඒ-3**
-	තැන්පතු		19,435,281	6,719,712	**ඒසීඒ-4**
-	අත්තිකාරම් ගිණුම්		38,613,385	28,744,493	**ඒසීඒ-5**
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවනලැබීම් (ආ)**		**2,064,060,666**	**1,541,059,205**	
-	**මුළු ආදායම් ලැබීම්සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**2,064,060,666**	**1,541,059,205**	
	භාණ්ඩාගාරයටප්‍රේෂණ(ඇ)		**10,700,219**	**1,042**	
	ශුද්ධ ආදායම් ලැබීම්සහ ආදායම් නොවන ලැබීම් ඉ= (ඇ)-(ඈ)		**2,053,360,447**	**1,541,058,163**	
	අඩුකළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**				
1,439,320,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	**5**	1,425,143,210	1,290,775,515	
584,787,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	**6**	431,008,503	351,048,407	**ඒසීඒ-2(ii)**
14,543,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	**7**	13,052,680	12,648,168	
-	පොළී ගෙවීම්	**8**	-	-	
-	වෙනත් පුනරාවර්තනවියදම්	**9**	-	-	
2,038,650,000	**මුළු පුනරාවර්තනවියදම් (ඊ)**		**1,869,204,394**	**1,654,472,091**	
	මූලධන වියදම්				

238,088,981	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	128,153,856	35,397,981	
416,100,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	229,457,058	23,499,117	
2,500,000	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	-	2,124,815	**ඒසිඒ-2(ii)**
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**	-	-	
4,500,000	හැකියා වර්ධනය	**14**	4,381,198	1,866,200	
68,761,019	වෙනත් මූලධන වියදම්	**15**	26,104,812	11,190,058	
729,950,000	**මුළු මූලධන වියදම් (උ)**		**388,096,924**	**74,078,172**	
	තැන්පතු ගෙවීම්		20,561,899	9,618,737	**ඒසිඒ-4**
	අත්තිකාරම් ගෙවීම්		48,542,880	23,679,415	**ඒසිඒ-5**
	වෙනත් ප්‍රධාන ලෙජර්ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**69,104,779**	**33,298,152**	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		2,326,406,097	1,761,848,415	
-	**දෙසැම්බර් 31 දිනටශේෂයඒ = (ඉ-එ)**		**(273,045,650)**	**(220,790,252)**	
	අග්‍රිම සැසඳුම්ප්‍රකාශය අනුව ශේෂය		**(273,045,650)**	**(220,790,252)**	**ඒසිඒ-7**
2,768,600,000	**දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය**		-	-	**ඒසිඒ-3**
			(273,045,650)	**(220,790,252)**	

2021 දෙසැම්බර් 31 දිනට **ඒසීඒ-පී**

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2021	2020
		තත්‍ය	
		රු.	රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	5,000,834,912	3,919,728,285
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	118,920,930	108,991,435
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**5,119,755,842**	**4,028,719,720**
ශුද්ධ වත්කම් /ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙතශුද්ධ වත්කම්		111,152,162	100,096,048
දේපළ පිරියත හාඋපකරණ සංචිතය		5,000,834,912	3,919,728,285
කුලී හා වැඩඅත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)	-	
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	7,768,768	
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**5,119,755,842**	**4,028,719,720**

පිටු අංක…06…….සිට ……89… දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින්ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන්පිටු අංක ……90…. සිට ……104…. දක්වා ඇතුළත්ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිමඅන්තර්ගත කොටස් වේ. මෙම මුලHප%කාYනපිළියෙල කිරීම පො¥වේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුක+ලව සි¥කර ඇති අතර මෙහිදීමුලH ප%කාYන්හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සු¥සු ගිණුම්කරණප%තිපත්ති භාවිතා කර ඇත¡ ඉහත අවසන් ගිණුමෙහිසඳහන් සංඛ්‍යා, ඊටඅදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරුභාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවාtමසxLHd සම`ග tක`ග වන බවටත් මෙයින් සහතිකකරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවයඅධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදිවෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :	නම :	නම :
තනතුර :	තනතුර :	
දිනය : 2022/02/25	දිනය : 24.02.2022	දිනය : 2022/02/24

කුමාරි වීරසේකර
ලේකම්
දේශීය වෙදකම් ප්‍රවර්ධන
ප්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන
ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශය.
අංක 26, 3 වන මහල, ශ්‍රී සංගරාජ මාවත,
කොළඹ 10.

ආචාර්ය එම්. ඩී. ජේ. අබේගුණවර්ධන
ආයුර්වේද කොමසාරිස්
ආයුර්වේද දෙපාර්තමේන්තුව
නාවින්න, මහරගම.

ඒ.එම්.එම්.කේ. අබේසිංහ
ප්‍රධාන ගණකාධිකාරී
ආයුර්වේද දෙපාර්තමේන්තුව
නාවින්න, මහරගම.

3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්

නැත.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු, 000

ආදායම් ක්ෂේත්‍රය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ප්‍රතිශතයක් ලෙස
2002.01.01	ගොඩනැගිලි කුලී	1,850,000	1,850,000	1,189,231.93	64.28%
2002.02.99	පොළිය	3,710,000	3,710,000	3,488,939.91	94%
2003.99.00	අනෙකුත් ආදායම්	2,600,000	2,600,000	18,785,065.37	72.25%

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු, 000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලබන ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	1,780,000	2,038,650	1,869,204.394	91.69
ප්‍රාග්ධන	452,000	729,950	388,096.924	53.17

3.7 මු. රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. 000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන,ලබා දුන් ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
01.	ජාතික අයවැය දෙපාර්තමේන්තුව	රෝහල් කාර්ය මණ්ඩලය සහ සෙසු කාරයමණ්ඩල වෙත කොරෝනා වෛරසය සඳහා ආරක්ෂිත උපකරණ සහ ඖෂධ නිෂ්පාදනය කිරීම	5,100	5,100	4,846	95%
02.	මැතිවරණ කොමිෂන් සභාව	මැතිවරණ රාජකාරී සඳහා දායක වූ නිලධාරීන් සඳහා ගෙවීම් කිරීම	958	958	958	100%
03.	දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශය	දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍ය නිල නිවස අළුත්වැඩියා කිරීම සඳහා	2,000	2,000	1,826	91.28%
04.	දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශය	දෙපාර්තමේන්තුවට වාහන ලබා ගැනීම සඳහා	20.4	20.4	20.4	100%

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු, 000

වත්කම් කේතය	කේත විස්තරය	2021.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2021.12.31දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	1,161,120.18	-	-
9152	යන්ත්‍රෝපකරණ	-	465,654.74	-	-
9153	ඉඩම්	-	2,338,520	-	-
9160	WIP(කෙරිගෙන යන වැඩ)	-	1,035,539	-	-

3.9 විගණකාධිපති වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. MED/A/AD/FA/21/03 ඔබේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2022 මැයි 31 දින

ගණන්දීමේ නිලධාරී
ආයුර්වේද දෙපාර්තමේන්තුව

ආයුර්වේද දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1.1 තත්ත්වාගණනය කළ මතය

ආයුර්වේද දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආයුර්වේද දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව් ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව ඉදිරියේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ආයුර්වේද දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය සහ මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී. ලං. වි. ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයන් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයින් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඡේද යොමුව	විගණන නිරීක්ෂණය	නිර්දේශය
ශීර්ෂය- 220 ආයුර්වේද දෙපාර්තමේන්තුව - 2020 154 (6) වාර්තාව		
1.6.2 (අ)	මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව, ඇප තැන්පත් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.	මුදල් රෙගුලාසි 891(1) හි සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනය පවත්වා ගත යුතුය.
1.6.2 (ආ)	හානි හා පාඩු ලේඛනය පිළියෙල කර තිබුණු නමුත් එය මුදල් රෙගුලාසි 110 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව පිළියෙල කර නොතිබුණු අතර එය යාවත්කාලීන කරද නොතිබුණි.	මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි හා පාඩු ලේඛනය පවත්වා ගත යුතුය.
1.6.3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.

1.6.4 (අ)	1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 10 වන වගන්තිය ප්‍රකාරව ආයුර්වේද ආරෝග්‍ය ශාලා, ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාර, ආයුර්වේද ඖෂධ ශාලා හෝ ආයුර්වේද බෙහෙත් ගබඩා ආයුර්වේද කොමසාරිස්වරයා විසින් ලියාපදිංචි කරනු ලැබිය යුතු වුවද, පංචකර්ම සහ සම්බාහන මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම පිළිබඳ විධිවිධාන පනතට ඇතුළත් කර නොතිබුණු බැවින් පංචකර්ම වෛද්‍ය ක්‍රමය භාවිතය නියාමනය කළ නොහැකිවී තිබුණි.	පංචකර්ම සහ සම්බාහන මධ්‍යස්ථාන නියාමනය සඳහා විධිමත් නෛතික රාමුවක් ඇතිකිරීම සඳහා කටයුතු කළ යුතුය.
3.2	මැදවච්චිය වකුගඩු රෝහල ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු මුදල් රු.85,372,218 ක් 2014 වර්ෂයේදී රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය වෙත යවා තිබුණි. 2019 දෙසැම්බර් මාසයේදී ඉදිකිරීම් අවසාන කිරීමෙන් පසු අතිරික්ත මිලදී ගැනීම් හේතුවෙන් ඉතිරි වූ රු.1,683,644 ක් වටිනා ගොඩනැගිලි ද්‍රව්‍ය දෙපාර්තමේන්තුවට බාරදී තිබුණි. නමුත් එපරිදි ඉතිරිව තිබුණු වානේ කම්බි, වටිනා ලී වර්ග ඇතුළු ගොඩනැගිලි ද්‍රව්‍ය රාශියක් අනාරක්ෂිතව, අක්‍රමවත්ව හා නිෂ්කාර්යව වර්ෂයකට අධික කාලයක් දෙපාර්තමේන්තු පරිශ්‍රයේ ගොඩගසා තිබුණි.	කාක්ෂණික දැනුම සහිත පුද්ගලයින් මඟින් පිළියෙල කරන විධිමත් පිරිවැය ඇස්තමේන්තුවලට අනුකූලව අවශ්‍යතාවය අනුව පමණක් ඉදිකිරීම් ද්‍රව්‍ය මිලදී ගත යුතුය. රජයට සිදුවන අලාභය අවම වන ආකාරයට සහ විනිවිද පෙනෙන ප්‍රසම්පාදන ක්‍රියාවලියකට අනුව නිෂ්කාර්ය වත්කම් බැහැර කිරීමට කටයුතු කළ යුතුය.

3.3	අවශ්‍යතාවය නිවැරදිව හඳුනා නොගෙන හා ශක්‍යතා අධ්‍යයනයකින් තොරව 2015 මාර්තු 16 දින රු.මිලියන 28 ක් වැයකර බණ්ඩාරනායක ආයුර්වේද පර්යේෂණායතනයට යන්ත්‍ර හා උපකරණ 14 ක් මිලදී ගෙන තිබුණු අතර ඉන් රු.මිලියන 21 ක් වටිනා යන්ත්‍ර 8 ක් 2021 ඔක්තෝබර් 15 වන විටත් සවිකර නොතිබුණි. මුළු පිරිවැය රු.14,591,311 ක් වූ යන්ත්‍ර 06 ක් නිෂ්පාදනාගාරය සඳහා අවශ්‍ය නොවන බවට 2020 ඔක්තෝබර් 05 දින පත්කර තිබුණු කමිටුවක් විසින් හඳුනාගෙන තිබුණි. නිසි කොන්ත්‍රාත් ගිවිසුමකට සහ සේවා හා අළුත්වැඩියා සඳහා ගිවිසුම්වලට එළඹීමකින් තොරව මෙම කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කර තිබුණු බැවින් සවිකර තිබුණු යන්ත්‍ර උපකරණද සමාලෝචිත වර්ෂය වන විට භාවිතයට ගත නොහැකි තත්වයේ පැවතුණි. මේ අනුව මෙම ව්‍යාපෘතිය සඳහා වැය කර තිබුණු රු.28,342,712 ක මුළු මුදල අනාර්ථික වියදමක් විය.	සියළුම යන්ත්‍ර ඵලදායී ලෙස උපයෝජනය කිරීමට හෝ ආයුර්වේද රෝහල්වල හෝ ආයුර්වේද සංස්ථාවේ ඖෂධ නිෂ්පාදනයට යොදා ගැනීම සඳහා ලබාදීමට කටයුතු කළ යුතු අතර අවශ්‍යතාවය නිවැරදිව හඳුනා නොගෙන හා නිසි ශක්‍යතා අධ්‍යයනයකින් තොරව මෙම මිලදී ගැනීම සඳහා දායක වූ සියළුම නිලධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගත යුතුය.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

2020 දෙසැම්බර් 31 දිනට නොනිමි වැඩ රු. 836,749,569 ක් හා එදිනට අදාළ වැය විෂයන්ට හර කර තිබුණු උපකරන මිලදී ගැනීම් රු.14,900,000 ක්, ඉකුත් වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණු බැවින් එම වියදම් සමාලෝචිත වර්ෂයේ දේපල පිරියත හා උපකරණ ගිණුමේ ආරම්භක ශේෂයට එකතුකර දක්වා තිබුණු නමුත් අදාළ සංශෝධනය පිළිබඳ ගිණුම් සටහන්වලින් අනාවරණය කර නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගෙන තිබුණු කාර්යාලීය ලී බඩු හා උපකරණ රු.4,697,345 ක් අදාළ වැය විෂයයන්ට හර කර තිබුණු නමුත් මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

1.6.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව හා දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත පවරාදී තිබුණු ප්‍රතිපාදන යටතේ වැයකර තිබුණු රු.204,055,596 කට අදාළ කාර්යයන් ඉටුකිරීම පිළිබඳව දෙපාර්තමේන්තුව විසින් අධීක්ෂණය කර නොතිබීම, පසුවිපරම්කර නොතිබීම හා වියදම්වලට අදාළ විස්තර ලබා ගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් එම ගනුදෙනු යතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

ලේඛන වර්ගය	අදාළ රෙගුලාසිය	නිරීක්ෂණය
භාණ්ඩ හා පාඩු ලේඛනය	මුදල් රෙගුලාසි 110	යාවත්කාලීන කර නොතිබුණි.
ඇප තැන්පත් ලේඛනය	මුදල් රෙගුලාසි 891(1)	යාවත්කාලීන කර පවත්වා නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1. වියදම් කළමනාකරණය

මුදල් රෙගුලාසි 50 හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව නිවැරදි හා තාත්වික ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණු බව පහතින් දැක්වෙන නිරීක්ෂණවලට අනුව තහවුරු විය.

(අ) මූලධන වැය විෂයයන් 05 ක් සඳහා සලසා ගෙන තිබුණු රු.15,500,000 ක් වූ සමස්ත ඇස්තමේන්තු ප්‍රතිපාදනයම ඉතිරිව තිබුණු අතර මූලධන වැය විෂයයන් 07 ක් සඳහා සලසාගෙන තිබුණු රු.34,600,000 ක ප්‍රතිපාදනවලින් රු.26,734,376 ක් හෙවත් සියයට 57 ත් සියයට 92 ත් අතර පරාසයක ප්‍රතිපාදන ඉතිරිව තිබුණි. තවත් මූලධන වැය විෂයයන් 02 ක් සඳහා සලසාගෙන තිබුණු රු.15,000,000 ක ප්‍රතිපාදනවලින් රු.6,738,981 ක ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණු අතර රු.7,288,520 ක ප්‍රතිපාදන ඉතිරිව තිබුණි. එසේම මූලධන වැය විෂයයන් 04 ක් සඳහා පරිපූරක ඇස්තමේන්තු මගින් රු.277,000,000 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණු නමුත් ඉන් රු.181,744,101 ක් ඉතිරිව තිබුණි.

(ආ) වෛද්‍ය සැපයුම් යටතේ වැය විෂයන් 02 ක් සඳහා සලසා තිබුණු රු.130,000,000 ක ප්‍රතිපාදනවලින් රු.42,879,976 ක් එම වැය විෂයන්හි අරමුණුගත කාර්යයන් සඳහා වැය නොකර වෙනත් වැය විෂයන්ට මාරුකර තිබුණු අතර රු.15,226,152 ක ප්‍රතිපාදන ඉතිරිව තිබුණි.

(ඇ) පුනරාවර්තන වැය විෂයයක් සඳහා පරිපූරක ඇස්තමේන්තු මගින් රු.245,000,000 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණු නමුත් ඉන් රු.103,712,290 ක් ඉතිරිව තිබුණි.

(ඈ) මූලධන වත්කම් අත්පත් කර ගැනීම් යටතේ යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ මිලදී ගැනීමට සලසා ගෙන තිබුණු රු. 67,500,000 ක පරිපූරක ප්‍රතිපාදනවලින් රු.11,809,305 ක් ලී බඩු උපකරණ මිලදී ගැනීමට වැයකර තිබුණි.

2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක (iii) ලෙස ඉදිරිපත් කරන බැරකම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබුණු රු.24,776,561 ක බැරකම්, මුදල් රෙගුලාසි 94(2) හා 94 (3) ප්‍රකාරව සටහන් අංක (iv) ලෙස ඉදිරිපත් කරන එළඹෙන ලද බැඳීම් පිළිබඳ ප්‍රකාශයේද ඇතුළත් කර තිබුණි.

(ආ) ඇණවුම්කර මිලදී ගැනීමේ ගිවිසුම්වලට එළඹ තිබුණද 2021 දෙසැම්බර් 31 දින වන විටත් ලැබී නොතිබුණු රෝහල් ගෘහ භාණ්ඩවල පිරිවැය රු.4,203,756 ක් හා පරිගණක හා උපාංගවල පිරිවැය රු.28,110,150 ක්, මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක **(iv)** ලෙස ඉදිරිපත් කරන එළඹෙන ලද බැඳීම් පිළිබඳ ප්‍රකාශයේ ඇතුළත්කර නොතිබුණි.

2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

නීති රීති විධිවිධානවලට යොමුව	අනුකූල නොවීම
(අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**	
(i) මුදල් රෙගුලාසි 103	මුළු අලාභය රු.165,850 ක් වූ වාහන අනතුරු 04 කට අදාළ රු.101,600 ක් රක්ෂණ වන්දිවලින් ආවරණය කර ගෙන තිබුණු නමුත් එම අනතුරු පිළිබඳව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ii) මුදල් රෙගුලාසි 371 (ආ)	තත්කාර්ය අතුරු අග්‍රිම අදාළ කාර්යයට ආසන්න දිනයකදී ලබාගෙන එම කාර්යය නිමකළ වහාම පියවිය යුතු වුවද, කාර්යය ආරම්භ කෙරෙන දිනට දින 02 ත් දින 10 ත් අතර කාලයකට පෙර අවස්ථා 11 කදී නිලධාරීන් 03 දෙනෙකු වෙත රු.218,960 ක තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණු අතර අවස්ථා 19 කදී නිලධාරීනියක විසින් ලබාගෙන තිබුණු රු.407,200 ක තත්කාර්ය අතුරු අග්‍රිම හා ඉතිරි මුදල් පියවීමට දින 11 ත් දින 123 ත් අතර කාලයක් ගතකර තිබුණි.

	(iii) මුදල් රෙගුලාසි 770(4)	ධාවනයෙන් ඉවත්කර වසර ගණනාවක් ගතව තිබුණු කැබරථ 02 ක්, බස් රථයක් හා යතුරු පැදි 05 ක් අළුත්වැඩියාකර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට හෝ කටයුතුකර නොතිබුණි.
	(iv) මුදල් රෙගුලාසි 756(6)	සමාලෝචිත වර්ෂය සඳහා වන භාණ්ඩ සමීක්ෂණ කටයුතු 2022 මාර්තු 15 දිනට පෙර අවසන් කළ යුතු වුවද, 2022 මැයි 15 දින වන විටත් එම කටයුතු අවසන් කර නොතිබුණි.
(ආ)	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය	රජයේ වාහනවල සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාල සීමාවකින් පසුව හෝ කිලෝමීටර් 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිම සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන දහනය පරීක්ෂා කළ යුතු වුවද දෙපාර්තමේන්තුවේ වාහන සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි.
(ඇ)	2019 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2(iv) ඡේදය	වේලාව පදනම් කර ගනිමින් අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීමේදී අදාළ කාලය ඇඟිලි සලකුණු යන්ත්‍ර මඟින් සනාථ කර ගත යුතු වුවද, ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතයකින් තොරව පැමිණීමේ ලේඛන පමණක් පදනම් කර ගනිමින් සමාලෝචිත වර්ෂය තුළදී අතිකාල හා නිවාඩු දින වැටුප් ලෙස රු.55,335,614 ක් ගෙවා තිබුණි.

2.4 අත්තිකාරම් ගිණුම් ශේෂ

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 1.6, 1.7 හා 6.3 වගන්ති හා 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 1.1.7 ඡේදය ප්‍රකාරව, ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ තෙමසක් තුළ නිරවුල් කළ යුතු වුවද, ස්ථාන මාරුවී ගිය නිලධාරීන් 10 දෙනෙකුගේ 2021 දෙසැම්බර් 31 දිනට වර්ෂ 05 ක කාල සීමාවක් ඉක්මවා තිබුණු නොපියවූ ණය ශේෂවල එකතුව රු.316,249 ක් විය.

(ආ) ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ 21.3 වගන්තිය ප්‍රකාරව, වැඩ තහනමට ලක්වූ නිලධාරීන් සම්බන්ධයෙන් පැවැත්වෙන විනය පරීක්ෂණ කටයුතු හැකිතාක් අප්‍රමාදව අවසන් කිරීම අත්‍යාවශ්‍ය වුවද, වැඩ තහනමට ලක්වී වර්ෂ 01 ත් වර්ෂ 03 ත් අතර කාලයක් ගතවී තිබුණු නිලධාරීන් 02 දෙනෙකුගෙන් රු.160,915 ක්ද, වර්ෂ 05 ක කාලයක් ඉක්මවා තිබුණු නිලධාරීන් 06 දෙනෙකුගෙන් රු.198,260 ක්ද, අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි.

(ඇ) ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 4.2.4 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව නිලධාරියෙකු විශ්‍රාම ගැනීමට නියමිතව ඇති කල්හි ඔහුගෙන් අයවිය යුතු සියළුම ණය පිළිබඳ විස්තර විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතු අතර, 4.2.5 වගන්තිය ප්‍රකාරව නිලධාරියාගේ පරිවර්තිත විශ්‍රාම වැටුපෙන් හෝ පාරිතෝෂික මුදල්වලින් හෝ අයකර ගත යුතුය. 2021 දෙසැම්බර් 31 දිනට විශ්‍රාමගොස් මාස 3 ක් ඉක්ම වූ නිලධාරීන් 12 දෙනෙකුගෙන් අයවිය යුතු මුළු ණය ශේෂය රු.853,222 ක් වූ අතර එම ණය අයකර ගැනීම සඳහා ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණු බව හෝ ඊට හේතුවූ වෙනත් කරුණු තිබේද යන බව හෝ විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. එම ණය ශේෂ අතරින් විශ්‍රාම ගිය නිලධාරීන් 03 දෙනෙකුගෙන් අයවිය යුතු වසර 04 කට වඩා පැරණි රු.62,050 ක්ද විය.

(ඈ) 2019 ජුනි 27 දිනැති අංක 05/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3(ඉ)(ii) ප්‍රකාරව, සේවය හැර ගිය නමුත් නැවත සේවයේ පිහිටුවා නොතිබුණු නිලධාරීන්ගේ ජාතික හැඳුනුම්පත් අංකය මැතිවරණ කොමසාරිස් වෙත ඉදිරිපත් කර පදිංචිය පිළිබඳව විස්තර විමසා ප්‍රාදේශීය ලේකම් මගින් එම නිලධාරීන්ගේ වත්කම් පිළිබඳව තහවුරු කර ගැනීමෙන් අනතුරුව නීතිපති මගින් ණය මුදල අයකර ගත යුතු වුවද, 2021 දෙසැම්බර් 31 දින වන විට සේවය හැරගිය නිලධාරීන් 23 දෙනෙකුගෙන් අයවිය යුතු මුළු ණය ශේෂය රු.1,207,060 ක් එපරිදි අයකර ගෙන නොතිබුණු අතර ඉන් සියයට 68 ක් හෙවත් රු.825,560 ක් වර්ෂ 05 කට වඩා වැඩි කාලයක් පැරණි ණය ශේෂ විය.

2.5 පාඩු හා හානිවීම

මංවංතොඩුවායි ආයුර්වේද රෝහලේ සේවය කර වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට ස්ථාන මාරුවී තිබුණු ආයුර්වේද වෛද්‍යවරයෙකුට 2012 ජූලි මාසයේ සිට 2013 සැප්තැම්බර් මාසය දක්වා මාස 15 ක් තුළදී දෙපාර්තමේන්තුව විසින් වැටුප් ලෙස රු.548,376 ක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව කටයුතු නොකර අවස්ථා 04 කදී රු.260,000 ක් පමණක් වාරික වශයෙන් අය කරගෙන තිබුණි. ඉතිරි රු.288,376 ක් ගෙවීම පැහැර හැර වසර 10කට ආසන්න කාලයක් ගතවී තිබුණු නමුත් අදාළ වෛද්‍යවරයාට එරෙහිව නීත්‍යානුකූලව කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යය සාධනය

3.1.1 සැලැසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙළ කර තිබුණු නමුත් ඊට අනුගතව දෙපාර්තමේන්තුවේ බොහෝ කටයුතු සිදුවී නොතිබුණු බවත්, අරමුණු හා ප්‍රතිපත්ති වෙනස් කිරීමේදී ඒ අනුව ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කර ප්‍රගතිය වාර්තා කිරීම කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමුව නොතිබුණු බවත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රගතිය පරීක්ෂා කිරීමේදී අනාවරණය විය.

(ආ) බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහලේ ඖෂධ නිෂ්පාදන අංශය මගින් තෙල වර්ග 23 කින් බෝතල් 13,500 ක් හා ගුගුල් වර්ග 08 කින් කිලෝ ග්‍රෑම් 790 ක් සමාලෝචිත වර්ෂය තුළදී නිෂ්පාදනය කිරීමට සැලසුම් කර තිබුණු නමුත් කාර්ය මණ්ඩල ඌනතාවය හා ඔසු අමුද්‍රව්‍ය ප්‍රමාණවත් පරිදි සපයා ගෙන නොතිබීම හේතුවෙන් තෙල වර්ග 09 කින් බෝතල් 2,977 ක් හා ගුගුල් වර්ග 07 කින් කිලෝ ග්‍රෑම් 268 ක් පමණක් නිෂ්පාදනය කර තිබුණි.

3.1.2 කාර්යයභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන 2001 වර්ෂයේ සිට 2005 වර්ෂය දක්වා නියමු ව්‍යාපෘතියක් ලෙස අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කර එහි සාර්ථකත්වය මත ව්‍යාපෘති ඇගයීමක් සිදු කොට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසු 2005 වර්ෂයේ සිට අනෙකුත් දිස්ත්‍රික්ක සඳහා සේවා ව්‍යාප්ත කරමින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතු වුවද අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පමණක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. 2005 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා රු.මිලියන 746 ක් වැය කර තිබුණු මෙම ව්‍යාපෘතිය සඳහා 2021 වර්ෂය වෙනුවෙන් සලසා තිබුණු රු.මිලියන 174.58 ක ප්‍රතිපාදනවලින් නිලධාරීන් 225 දෙනෙකුට වැටුප් හා දීමනා වශයෙන් රු.මිලියන 131.95 ක්ද අනෙකුත් වියදම් සඳහා රු.මිලියන 19.25 ක්ද වශයෙන් මුළු එකතුව රු.මිලියන 151.2 ක් වැයකර තිබුණි.

(ආ) ආයුර්වේද සංරක්ෂණ සභාවල පාරම්පරික වෛද්‍යවරුන්ගේ ඔසු උයන් සංවර්ධනයට රු.500,000 ක්ද, පර්යේෂණ රෝහල්වලට අවශ්‍ය ආයුර්වේද පර්යේෂණ උපකරණ මිලදී ගැනීම සඳහා රු.5,000,000 ක්ද හා ඖෂධ පැළැටි සංරක්ෂණ ව්‍යාපෘතිය යටතේ තරුණ ඔසු ගොවි ගම්මාන වැඩසටහන සඳහා රු.12,000,000 ක්ද වශයෙන් ප්‍රතිපාදන වෙන් කර තිබුණු නමුත් එම කාර්යයන් ඉටු කර නොතිබුණි.

(ඇ) ආයුර්වේද ශික්ෂණ සහ පර්යේෂණ රෝහල් 06 ක අත්‍යවශ්‍ය නඩත්තු, අලුත්වැඩියා හා සංවර්ධන කටයුතු සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන රු.138,860,000 ක ප්‍රතිපාදන සලසා ගෙන ඒවා ක්‍රියාකාරී සැලැස්මටද ඇතුළත් කර තිබුණු නමුත්, බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහලේ අළුත්වැඩියා කටයුතු 05 ක්ද, යක්කල ආයුර්වේද ශික්ෂණ රෝහලේ අළුත්වැඩියා කටයුතු 05 ක්ද, ත්‍රිකුණාමලය ශික්ෂණ රෝහලේ අළුත්වැඩියා කටයුතු 01 ක්ද, ඛණ්ඩාරණායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණාගාරයේ අළුත්වැඩියා කටයුතු 02 ක්ද, කයිතඩි සිද්ධ ශික්ෂණ රෝහලේ අළුත්වැඩියා කටයුතු 02 ක් හා ඉදිකිරීමක්ද, මිහින්තලේ ශික්ෂණ රෝහලේ සංවර්ධන කටයුත්තක්ද ඉටුකර නොතිබුණි.

(ඇ) ඇස්තමේන්තු ගත මුළු පිරිවැය රු.350,000,000 ක්වූ පාරම්පරික වෛද්‍ය දැනුම සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතියේ II වන අදියර 2020 වර්ෂයේ සිට ඉදිරි වර්ෂ 04 ක් තුළ ක්‍රියාත්මක කිරීම සඳහා 2019 අප්‍රේල් 03 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණු නමුත් 2020 වර්ෂයේද ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා රු.10,000,000 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණු නමුත් ක්‍රියාකාරී සැලැස්ම අනුව ඇස්තමේන්තු පිරිවැය රු.8,800,000 ක් වූ කාර්යයන් 05 ක් පමණක් ඉටුකිරීමට සැලසුම් කර තිබුණි. එසේ වුවද, රු.1,759,664 ක් වැයකර කාර්යයන් 02 ක් පමණක් ඉටුකර තිබුණි. ඒ අනුව ව්‍යාපෘතියට අත්‍යවශ්‍ය උපකරණ මිලට ගැනීම, පාරම්පරික වෛද්‍යවරුන් ඇඟයීම සහ පාරම්පරික දැනුම සංරක්ෂණය කිරීමේ පරිගණක පද්ධතිය ස්ථාපිත කිරීම යන කාර්යයන් ඉටුකර නොතිබුණි.

(ඉ) ආයුර්වේද ශික්ෂණ හා පර්යේෂණ රෝහල්වල මාතෘ හා ළමා සායන අලුත්වැඩියාව හා වැඩි දියුණු කිරීම, කාණු පද්ධතිය නැවත ගොඩනැගීම හා ගොඩනැගිලි අලුත්වැඩියාව ශික්ෂණ රෝහල්වල රසායනාගාර පහසුකම් වැඩිදියුණු කිරීම සහ බොරැල්ල රෝහලේ නිෂ්පාදනාගාරය වැඩි දියුණු කිරීම යන කාර්යයන් නිශ්චිතව දක්වමින් මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම් වැය විෂය යටතේ රු.179,500.000 ක පරිපූරක ප්‍රතිපාදන සලසාගෙන තිබුණද අදාළ නිශ්චිත කාර්යයන් ක්‍රියාකාරී සැලැස්මට හෝ ඇතුළත් නොකර වෙනත් අලුත්වැඩියා කාර්යයන් 12 ක් සඳහා රු.76,646,480 ක් වැයකර තිබුණි.

(ඊ) ආයුර්වේද ශික්ෂණ සහ පර්යේෂණ රෝහල්වල මාතෘ හා ළමා සායන සඳහා උපකරණ මිලදී ගැනීම, ශික්ෂණ රෝහල්වල රසායනාගාර සඳහා උපකරණ මිලදී ගැනීම, පර්යේෂණ රෝහල් සඳහා උපකරණ මිලදී ගැනීම හා බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහලේ ඖෂධ නිෂ්පාදනාගාරයට උපකරණ මිලදී ගැනීම යන කාර්යයන් නිශ්චිතව දක්වමින් මූලධන වත්කම් අත්පත් කර ගැනීම් වැය විෂය යටතේ රු.67,500,000 ක පරිපූරක ප්‍රතිපාදන සලසාගෙන තිබුණු නමුත් රු. 6,334,319 ක උපකරණ පමණක් මිලදී ගෙන තිබුණි.

(උ) අමාත්‍ය කාර්යාලය, අමාත්‍යාංශ කාර්යාලය, ආයුර්වේද දෙපාර්තමේන්තුව හා එහි අනුබද්ධ ආයතන, රෝහල්, වෛද්‍ය මධ්‍යස්ථාන ඇතුළු සම්පූර්ණ ආයතන පද්ධතියම ඇතුළත්වන පරිදි කළමනාකරණ දත්ත පද්ධතියක් සැකසීම සඳහා රු.25,000,000 ක පරිපූරක ප්‍රතිපාදන සලසාගෙන තිබුණු නමුත් එම කාර්යය ඉටු කර නොතිබුණි.

3.1.3 කාර්යය සාධන දර්ශක

දෙපාර්තමේන්තුව හා එහි අනුබද්ධ ආයතන, රෝහල්, වෛද්‍ය මධ්‍යස්ථාන ඔසු උයන් ඇතුළු සම්පූර්ණ ආයතන පද්ධතියට අදාළ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය ඇගයීම සඳහා කාර්යසාධන දර්ශක පිහිටුවා නොතිබුණු අතර ක්‍රියාකාරකම්වල ප්‍රගතිය සමාලෝචනය කරද නොතිබුණි.

3.1.4 වාර්ෂික කාර්යසාධන වාර්තාව

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන සමඟ 2021 වාර්ෂික කාර්යසාධන වාර්තාවේ කෙටුම්පතක් ඉදිරිපත්කර තිබුණු නමුත් එය 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය යටතේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව නිවැරදිව පිළියෙල කර නොතිබුණි.

(ආ) 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව, ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසානවී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවද, 2020 වර්ෂයේ කාර්යසාධන වාර්තාව 2022 මැයි 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

3.1.5 තිරසර සංවර්ධන අරමුණු

2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනතේ 3.6, 3.9, 11 හා 11.2 වගන්ති ප්‍රකාරව, ආයතනයේ අරමුණු ළඟාකර ගැනීම උදෙසා සිය සම්පත් කාර්යක්ෂමව මෙහෙයවිය යුතු අතර තිරසර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම පිණිස ආයතනය විසින් සපුරාගත යුතු ඉලක්කයන් හා එම ඉලක්කයන් සපුරා ගැනීම සඳහා පවතින පරතරයන්ද, ප්‍රගතිය මැන බැලීම සඳහා සුදුසු දර්ශකයන්ද හඳුනාගත යුතුය. නමුත් දෙපාර්තමේන්තුව විසින් එවැනි දර්ශකයන් හඳුනාගෙන අරමුණුවලින් ලඟාකරගත් ප්‍රමාණය හා බැහැරවීම් මෙන්ම අවධානය යොමු කළ යුතු විවිධ ක්ෂේත්‍රයන් හඳුනාගෙන නොතිබුණි.

3.2 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රය, බොරැල්ල ශික්ෂණ රෝහල ඇතුළුව රෝහල්, ඔසු උයන්, ප්‍රජා සෞඛ්‍ය ප්‍රාදේශීය කාර්යාල හා සංචාරක බංගලා ඉඩම් 17 ක් දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන නොතිබුණි. එසේ වුවද, සමාලෝචිත වර්ෂය තුළදී මෙම ඉඩම්වල නව ඉදිකිරීම් සඳහා රු.21,059,428 ක් හා නඩත්තු කටයුතු සඳහා රු.29,274,335 ක් වැයකර තිබුණි.

(ආ) 2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොමිස්තෝලර් ජනරාල් කාර්යාලය වෙත වාර්තා කර නොතිබුණි.

3.3 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී මුළු පිරිවැය රු.20,799,715 ක් වූ අයිතම 23 කට අයත් කාර්යාලීය ගෘහ භාණ්ඩ ඒකක 1,239 ක් හා මුළු පිරිවැය රු.6,987,850 ක් වූ රෝහල් ගෘහ භාණ්ඩ ඒකක 312 ක් මාතලේ ප්‍රදේශයේ සැපයුම්කරුවකුගෙන් මිලදී ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයේදී ප්‍රසම්පාදනය සැලසුම් කර තිබීම, කාර්යාලීය ලී බඩු උපකරණ මිලදී ගැනීම සඳහා පත්කළ තාක්ෂණික ඇගයීම් කමිටුවට විෂයය විශේෂඥයකු පත්කර නොතිබීම, පිරිවිතර සැකසීම හා එම පිරිවිතරවලට අනුකූලව උපකරණ ලබාගැනීම සම්බන්ධව ප්‍රමාණවත් සැලකිල්ලක් දක්වා නොමැතිවීම, සියළුම උපකරණ පිරිවිතරවලට අනුකූලව ලැබී ඇති බවට විධිමත්ව තහවුරු කර ගැනීමකින් තොරව ගෙවීම් කර තිබීම, ඇණවුම්කළ ප්‍රමාණයට වඩා වැඩියෙන් සපයා තිබුණු උපකරණ සඳහා ගෙවීම් කිරීම, ඇණවුම්කළ උපකරණවලට වඩා වෙනස් උපකරණ භාරගැනීම සහ ගෙවීම් කිරීම, ප්‍රමාද ගාස්තු අයකර නොතිබීම සහ ප්‍රතිපාදන සලසා නොගත් වැය විෂයයක් යටතේ රු.11,809,305 ක් ගෙවීම් කිරීම යන අඩුපාඩු මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ පැවැති බව නිරීක්ෂණය විය.

(ආ) දේශීය ඖෂධ මගින් කොවිඩ් 19 වසංගතය පාලනය කිරීමට එකක පිරිවැය රු.1,000 ක් වූ සුවධරණී ඖෂධ මංජුසා ලක්ෂ 60 ක් බෙදාදීමේ ව්‍යාපෘතියක් සඳහා අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබාගෙන තිබුණි. ආරම්භයේදී බස්නාහිර පළාතට ඖෂධ මංජුසා 250,000 ක් සැපයීමට රු.250,000,000 ක පරිපූරක ප්‍රතිපාදන සලසා ගෙන ඉන් රු.142,562,809 ක් වැය කර තිබුණි. ඖෂධ මංජුසා සැකසීමේ සියළුම කාර්යයන් එක් සැපයුම්කරුවෙකු වෙත ලබා දීමට හැකිවන පරිදි මිලගණන් කැඳවීමෙන් ගතවන කාලය අවම කර ගත හැකි බව හා නිෂ්පාදනවල තත්ත්වය, අපතය හා පිරිවැය අවම කරගත හැකි බව යනාදී කරුණු කෙරෙහි අවධානය යොමු නොකොට ඖෂධ හා කැඳ නිෂ්පාදනයට සැපයුම්කරුවන් 07 දෙනෙක්ද, ඇසුරුම් මුද්‍රණයට එක් සැපයුම්කරුවෙක්ද, කාඩ්බෝඩ් පෙට්ටි හා අත්පත්‍රිකා මුද්‍රණයට එක් සැපයුම්කරුවෙක්ද, ඖෂධ හා කැඳ ඇසුරුම් කිරීමට සැපයුම්කරුවන් 07 දෙනෙක්ද වශයෙන් ඉහා සංකීර්ණ ක්‍රියාවලියක් මත සැපයුම්කරුවන් තෝරාගෙන තිබුණි. තවද, ලංසු ඇගයීමේදී පැවති විවිධ අඩුපාඩු පසුව සම්පූර්ණ කිරීමට යටත්ව සැපයුම්කරුවන් තෝරා ගැනීම, තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ නොයලකා කටයුතු කිරීම, සියලුම ප්‍රසම්පාදනයන් නියමිත දිනට අවසන් නොකිරීම, ප්‍රසම්පාදන මණ්ඩලයේ අනුමැතිය රහිතව කාලය දීර්ඝ කිරීම, ප්‍රමාද ගාස්තු අය නොකිරීම, මිල කමිටුවේ මිල ගණන් ඉක්මවා ගෙවීම් කිරීම යන අඩුපාඩු මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ පැවැති බව නිරීක්ෂණය විය. ඖෂධ මංජුසා සඟවා ආරක්ෂිතව ගබඩා නොකිරීම, අක්‍රමවත් බෙදාහැරීම, ඖෂධ පිරවීමටත් පෙර ඇසුරුම්වල කල් ඉකුත් වීමේ දිනය මුද්‍රණය කර තිබීම හේතුවෙන් ඇතැම් ඖෂධ කල් ඉකුත් වූ සේ සලකා ඉවත් කිරීම, කල් ඉකුත්වීමට පෙර ඖෂධ භාවිතා කිරීමට ප්‍රමාණවත් කාලයක් ප්‍රතිලාභීන්ට ලැබී නොතිබීම, ඉලක්ක ගත ප්‍රතිලාභීන් වෙත ඖෂධ ලැබීම සහ භාවිතය පිළිබඳ අධීක්ෂණය නොකිරීම හා පසුවිපරම් නොකිරීම, බස්නාහිර පළාතට බෙදා හැරීමට සැලසුම් කළ මංජුසා 250,000 කින් 183,776 ක්ම ගම්පහ දිස්ත්‍රික්කයේ පමණක් බෙදා හැර තිබීම, දින 60 ක් තුළ දිවයින පුරා මංජුසා ලක්ෂ 60 ක් බෙදාහැරීම සඳහා හදිසි ප්‍රසම්පාදන ක්‍රම අනුගමණය කිරීමට

අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණු නමුත් 2021 දෙසැම්බර් 31 දිනට දින 122 ක් ගතව තිබුණද ව්‍යාපෘතියෙන් සියයට 5 ක් වත් අවසන්කර නොතිබීම, යනාදී අඩුපාඩු වැඩිදුරටත් නිරීක්ෂණය විය.

3.4 කළමනාකරණ දුර්වලතා

දෙපාර්තමේන්තුව සතුව බස් රථ 02 ක්, ලොරි රථ 02 ක්, කැබ් රථ 09 ක්, වෑන් රථ 07 ක්, මෝටර් කාර් 05 ක්, ජීප්රථ 02 ක්, ගිලන්රථ 09 ක්, ත්‍රීවිලර් 06 ක් හා ට්‍රැක්ටර් යතුරුපැදි ඇතුළු වාහන 55 ක් පැවැති අතර සමාලෝචිත වර්ෂය තුළදී මෙම වාහනවලට ඉන්ධන සැපයීම හා අළුත්වැඩියාවන් සඳහා රු.13,172,415 ක් වැයකර තිබුණි. නමුත් මෙම වාහනවලට අදාළ ලොග් පොත්, ධාවන සටහන් විධිමත් පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබීම, ඉන්ධන පරීක්ෂාවන් සිදුකර නොතිබීම, සේවා කිරීම් හා අළුත්වැඩියාවන් ප්‍රමාදයකින් තොරව සිදුනොකිරීම, වාහන සඳහා ඉන්ධන පිරවීමේදී එම කටයුතු මාණ්ඩලික නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ සිදුකර නොතිබීම, වාහන අනතුරු සම්බන්ධයෙන් පොලිසියට පැමිණිලි නොකිරීම, විධිමත් පරිදි ප්‍රමාදයකින් තොරව පරීක්ෂණ පවත්වා අදාළ වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකිරීම් සිදුනොකර රක්ෂණ වන්දි මගින් අලාභ ආවරණය කරගැනීමට පමණක් යොමුව තිබීම සහ රියදුරන්ගේ අක්‍රමිකතාවයන් වලක්වා ගැනීම සඳහා ප්‍රමාණවත් පාලන ක්‍රම අනුගමනය නොකිරීම යනාදී කරුණු හේතුවෙන් දෙපාර්තමේන්තුවේ වාහන පරිපාලනය හා වාහනවල ආරක්ෂාව සම්බන්ධයෙන් සතුටුදායක තත්ත්වයක් නොපැවැති බව නිරීක්ෂණය විය.

4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුව සඳහා කළමනාකරණ දත්ත පද්ධතියක් සකස් කර ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණු නමුත් 2022 මැයි මාසය අවසන් වන තෙක් අදාළ දත්ත පද්ධතිය ස්ථාපිත කර නොතිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව හා එහි අනුබද්ධ ආයතන, රෝහල්, වෛද්‍ය මධ්‍යස්ථාන ඇතුළු සම්පූර්ණ ආයතන පද්ධතියට අදාළ යාවත්කාලීන කළමනාකරණ තොරතුරු කාර්යක්ෂමව ලබා ගැනීමට අපහසුව පැවැති අතර දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩල පැමිණීම හා පිටවීම සටහන් කිරීමේ පාලනය, කාර්යසාධන පාලනය, වැටුප් පාලනය, අතිකාල වියදම් පාලනය, පුද්ගලික ලිපිගොනු පාලනය යනාදී පාලනයන් දුර්වල මට්ටමක පැවැති බව නිරීක්ෂණය විය.

(ආ) ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ අධිශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන් විසින් දැරිය යුතු තනතුරු 18 ක් දෙපාර්තමේන්තුවේ පැවතියද ඉන් තනතුරු 02 කට පමණක් ස්ථිර නිලධාරීන් පත් කර තිබුණු අතර තනතුරු 09 කට රාජකාරී ආවරණ හා තාවකාලික පදනම මත පත්කිරීම් සිදු කර තිබුණි. ඉතිරි තනතුරු 06, 2022 මැයි 30 දින වන විටත් පුරප්පාඩුව පැවතුණි.

අයි. සමරගේ
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

4. පරිච්ඡේදය

04. කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

2021 වර්ෂය සඳහා සකස් කර නොමැත, 2022 වර්ෂය සඳහා සකස් කරමින් පවතී.

5. පරිච්ඡේදය

05. තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 2021 වර්ෂය සඳහා තිරසාර අරමුණු හඳුනා ගෙන නොමැති අතර 2022 වර්ෂය සඳහා සකස් කරමින් පවතී.

5.2 තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ අභියෝග

හඳුනාගනිමින් පවතී.

6. පරිච්ඡේදය

6. මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	731	618	93
තෘතීයික	48	09	39
ද්විතීයික	542	225	317
ප්‍රාථමික	1,041	529	512

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපා ඇති ආකාරය

- ආයතනයේ පවතින ඇබෑර්තු හේතුවෙන් දෛනික කටයුතු සිදු කිරීමට දැඩි බාධාවක් එල්ල වී ඇත.
- නිලධාරීන්ගේ කාර්ය බහුලත්වය නිසා කායික හා මානසික පීඩනය හේතුවෙන් සමස්ථ ඉලක්ක කරා ළඟාවීමට අපහසු වීම.

6.3 මානව සම්පත් සංවර්ධනය

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු)		වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය)
				දේශීය	විදේශීය	
01	කාර්ය මණ්ඩලය පුහුණු වැඩසටහන	සංවර්ධන නිලධාරී - 03 රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර 06	දින 03	දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශය		දේශීය
02	දෙමළ භාෂා පැය 150	සංවර්ධන නිලධාරී - 01 රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර 06 ප්‍රජා සෞඛ්‍ය සංවර්ධන නිලධාරී - 01 ලේඛන භාරකරු - 01	දින 18	මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය		දේශීය
03		දෙමළ භාෂා පැය 150 රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර 01	දින 18	යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය		දේශීය
04	කාර්යාල කාර්ය සහයකයින් සහ රියදුරන්ගේ ආකල්ප හා වෘත්තීය දැනුම ඉහළ නැංවීම පිළිබඳ ප්‍රහුණු වැඩමුළුව	ආයුර්වේද සේවා සහයක 02	දින 02	නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය		දේශීය
05	Management Training Programme for special Grade Nursing Officers 2019 batch	විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරි	දින 10	සෞඛ්‍ය අමාත්‍යාංශය		දේශීය

07. අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී මඟ හරවා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම.	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.6	වෙනත්	අදාළ නොවේ		
2	පොත් පත් හා ලේඛන නඩත්තු කිරීම (මූ.රෙ 445)			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අදාළ නොවේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී මඟ හරවා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මූ.රෙ 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුල බලතල පවරාදී තිබීම.	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම.	අනුකූල වේ		
3.3	සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම.	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රෙල්ඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම.	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලස්ම සකස් කිරීම.	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NDB) නියමිත දිනට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත්කර තිබීම.	අනුකූල වේ		
5	**විගණන විමසුම**			

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී මහ හරවා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මූ.රෙ 134(2) DMA/1 – 2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම.		පුහුණු සේවකයින් සංඛ්‍යාව ප්‍රමාණවත් නොවීම.	හැකි සෑම විටම නියමිත දිනට පිළිතුරු ලබා දීමට කටයුතු කරයි.
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව. සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම.	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම.	වාර්තා කිරීම සඳහා තොරතුරු සකස් කරමින් පවතී		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී මහ හරවා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්ථා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම.	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම.	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල නොවේ	පසුගිය වර්ෂ දෙකක පමණ ධාවන සටහන් පරීක්ෂා කර නොතිබීම නිසා ප්‍රමාණවත් කාලයක් නොතිබීම	එම වර්ෂ වල ධාවන සටහන්ද පරීක්ෂා කරමින් පවතී
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම.	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කරගෙන පවත්වාගෙන යාම.	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම.	අනුකූල වේ		
9.6	කල්බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහන වල ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම.	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී මඟ හරවා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිවැරදි කර තිබීම.	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කල යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම.	අනුකූල වේ		
11.2	මු.රෙ 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම.	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම.	අනුකූල වේ		
12.2	හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම.	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
13	පොදු තැන්පත් ගිණුම			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට පේෂණය කර තිබීම.	අනුකූල වේ		
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්යය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
14.3	මු.රෙ 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්යය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී මඟ හරවා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම.	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කොට තිබීම.	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්යය මණ්ඩල සීමාව තුළ කාර්යය මණ්ඩලය පවත්වාගෙන යාම.	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම.	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට අවස්ථාව සලසා තිබීම.	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී මඟ හරවා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල නොවේ	පවතින සීමිත මානව හා භෞතික සම්පත් අනුව මෙම කටයුතු නිවැරදිව ක්‍රියාත්මක කල නොහැක.	ඉදිරියේදී අවශ්‍ය මානව හා භෞතික සම්පත් ලැබීම අනුව කටයුතු කරනු ලැබේ.
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදයේ පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කාරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල නොවේ	පවතින සීමිත මානව හා භෞතික සම්පත් අනුව මෙම කටයුතු නිවැරදිව ක්‍රියාත්මක කල නොහැක.	ඉදිරියේදී අවශ්‍ය මානව හා භෞතික සම්පත් ලැබීම අනුව කටයුතු කරනු ලැබේ.
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල නොවේ	පවතින සීමිත මානව හා භෞතික සම්පත් අනුව මෙම කටයුතු නිවැරදිව ක්‍රියාත්මක කල නොහැක.	ඉදිරියේදී අවශ්‍ය මානව හා භෞතික සම්පත් ලැබීම අනුව කටයුතු කරනු ලැබේ.
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12ට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුල තහවුරු කොට තිබීම.	අනුකූල නොවේ	පවතින සීමිත මානව හා භෞතික සම්පත් අනුව මෙම කටයුතු නිවැරදිව ක්‍රියාත්මක කල නොහැක.	ඉදිරියේදී අවශ්‍ය මානව හා භෞතික සම්පත් ලැබීම අනුව කටයුතු කරනු ලැබේ.
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්යය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල නොවේ	පවතින සීමිත මානව හා භෞතික සම්පත් අනුව මෙම කටයුතු නිවැරදිව ක්‍රියාත්මක කල නොහැක.	ඉදිරියේදී අවශ්‍ය මානව හා භෞතික සම්පත් ලැබීම අනුව කටයුතු කරනු ලැබේ.

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී මඟ හරවා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග
19.4	ඉහත සඳහන් චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළබඳ වගකීම පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම.	අනුකූල නොවේ	පවතින සීමිත මානව හා භෞතික සම්පත් අනුව මෙම කටයුතු නිවැරදිව ක්‍රියාත්මක කල නොහැක.	ඉදිරියේදී අවශ්‍ය මානව හා භෞතික සම්පත් ලැබීම අනුව කටයුතු කරනු ලැබේ.
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල වේ		

Department of Government Printing